# එක්සත් ජාතීන්ගේ මහා සමුළුව



## “වර්තමාන අර්බුදවලට හේතුව ලෝක ප්‍රශ්න දෙස මානුෂික ඇසකින් නො බැලීමයි....”

–ආර්. ප්‍රේමදස

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමාගේ දේශනය

1980 සැප්තැම්බර් 29

BKT 0189
26/08/2023

# අග්‍රාමාත්‍ය
# ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා
# එක්සත් ජාතීන්ගේ මහ ලේකම්
# ආචාර්ය කුර්ට් වෝල්ඩ්හයිම් සමග

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



සභාපතිතුමනි,

මහලේකම්තුමාණෙනි,

සම්භාවනීය නියෝජිතවරුනි.

මෙම උත්තරීතර ජාත්‍යන්තර සම්මේලනයේ දී ශ්‍රී ලංකාවාසී ජනතාවගේ සහෝදරාත්මක සුහද සුබ පැතුම තමුන්නාන්සේලා වෙත පිරිනමන්නට ලැබීම මට ලැබුණු විශිෂ්ඨ වරප්‍රසාදයක් ලෙස මම සළකනවා. මා තමුන්නාන්සේලා අමතන්නේ, 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පිහිටුවන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළමුවැනි අග්‍රාමාත්‍යවරයා හැටියටයි.

තමුන්නාන්සේලා දන්නා පරිදි අපගේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කරනු ලැබුවේ නිදහස් ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබූ ශ්‍රී ලංකාවේ මහජන නියෝජිතවරුන් විසිනුයි. ඔවුන් තේරුණේ පොදු ජන වරමකිනුයි. ඒ ජනවරම විසින් අපගේ රජය පාර්ලිමේන්තුවේ ආසන සංඛ්‍යාවෙන් හයෙන් පහක අති විශිෂ්ඨ බලයක් සහිතවයි පත් කරනු ලැබුවේ.

හරබර, ගැඹුරු අලංකාර වචන හසුරුවමින් චතුර කථිකත්වයක් තමුන්නාන්සේලා හමුවේ ප්‍රදර්ශනය කිරීම හෝ අද ලෝකය මුහුණ පාන ගැඹුරු ප්‍රශ්න පිළිබඳව දීර්ඝ දේශනයක් පැවැත්වීම හෝ මා සතු කාර්ය භාරය ලෙස මා සළකන්නේ නැහැ.

සියළු සැප සම්පතකින් පිරුනු සමාජ හා ආර්ථික රටාවකින් හෙබි මනෝරාජ්‍යයකට ඇතුල්වීමෙ යතුර මා අතේ තිබේ යයි යන හැඟීමකින් යුතුව තමුන්නාන්සේලා හමුවේ කථා කිරීමේ අදහසක් මා තුළ නැහැ.

මා තමුන්නාන්සේලා හමුවේ පෙනී සිටින්නේ සාමය, යුක්තිය හා සමානාත්මතාවය සොයා මිනිස් සංහතිය විසින් ගෙන යන ප්‍රයත්නයේ දී තමුන්නාන්සේලා සමඟ එකට එක්වී ඊට රුකුල්දීමෙ නිහතමානී හැඟීමෙන් යුතුවයි.

කාලාන්තරයක් මුළුල්ලේ ජන සම්මතවාදය අනුගමනය කිරීම හේතු කොටගෙන ලැබුවාවූ දීර්ඝ අත්දැකීම නියා සාමය, යුක්තිය හා සමානාත්ම භාවය වැනි උදර සාර ධර්මයන් කෙරෙහි අප ජනතාව තුළ ඇත්තේ අචල හක්තියක් ; විශ්වාසයක්.

2—ඒ 51844

ශ්‍රී ලංකාවාසී ජනතාව සර්වජන ඡන්දයට හිමිකම ලැබුවේ මීට අවුරුදු පණහකට පෙරදීයි. ඒ සැමරීමේ ජයන්තිය ලබන වසරේදී පැවැත්වීමට අපි අදහස් කරනවා. අපේ ජනතාවගේ හදවත් තුළ ගැබ්වී ඇති ගැඹුරු ආධ්‍යාත්මික හැඟීම් නිසා මා සඳහන් කළ එම උදාර සාර ධර්මයන් පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ ඔවුන් තුළ ලොකු කැපවීමක් තිබෙනවා.

අවුරුදු තිහකට වැඩි මගේ දේශපාලන ජීවිතය තුළදී මා ලබාගත් අත්දැකීම් අප්‍රමාණයි. නගරයේ මුඩුක්කුවල හෝ වේවා ඈත පිටිසර ගම්මානවල හෝ වේවා ජීවත්වන සැම තරාතිරමකම ජනතාව සමඟ එකට එක්වී වැඩ කිරීමේ අවස්ථාව මට උදාවුණා. රජයේ හෝ වේවා ඊට පිටස්තර හෝ වේවා එම ජනතාව සමග වැඩ කිරීමෙන් මා ලැබූ පුළුල් අත්දැකීම තුළින් සකස් කරගත් මගේ සිතුම් පැතුම් සමහරක් තමුන්නාන්සේලා සමඟ බෙදා හදා ගැනීමේ ආශාවක් මා තුළ තිබෙනවා.

සභාපතිතුමනි, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා සම්මේලනයේ තිස්පස්වැනි සැසිවාරයේ සභාපති ධුරයට තමුන්නාන්සේගේ තේරී පත්වීම ගැන, පෞද්ගලිකව මගේත් විශේෂයෙන් මගේ නියෝජිත මණ්ඩලයේත් සුභාශී යනය ප්‍රථමයෙන් තමුන්නාන්සේට පිරිනමනවා. තමුන්නාන්සේගේ රටත්, අපගේ රටත් දීර්ඝ කාලයක් තිස්සේ දෘඩ මිත්‍ර භාවයකින් හා කිට්ටු සහයෝගිතාවයකින් බැඳී කටයුතු කර තිබෙනවා. ශ්‍රී ලංකා වාසීන්වූ අපි එය ඉතා අගයකොට සළකනවා.

රාජ්‍යතන්ත්‍රයෙහිලා තමුන්නාන්සේ සතුව ඇති දීර්ඝ අත්දැකීමත්, ප්‍රායෝගික බුද්ධියත්, මේ සැසිවාරයේ සාකච්ඡා මාලාව නිසිමඟ යොමු කිරීමෙහිලා මහෝපකාරීවන බවට මා තුළ ඇත්තේ දෘඩ විශ්වාසයක්. අපගේ නියෝජිත පිරිසේ සුහද සුබ පැතුම් තමුන්නාන්සේට පිරිනමන අතර තමුන්නාන්සේ හමුවේ ඇති වැදගත් කාර්ය භාරය සාර්ථකව ඉටුකිරීමෙහිලා අපේ සම්පූර්ණ සහයෝගය ද පිරිනමන්නේ ඉතා සාදරයෙන්.

කලින් මෙම සභාවේ සභාපති ධුරය දැරූ වෙනිසියුලාවේ සාලිම් තානාපති වරයාටද මේ අවස්ථාවේදී මගේ සම්මානය පිරිනැමීමට කැමතියි. එතුමාගේ සභාපතිත්වය යටතේ පැවති විශේෂ සහ අති විශේෂ සැසිවාරයන් ගැන සළකා බලන කළ එතුමා සභාපතිත්වය දැරූ කාලපරිච්ඡේදය තුළදී එතුමාගේ අපක්ෂපාති භාවයත්, නිසිලෙස කරුණු අවබෝධකර ගැනීමේ ශක්තිය හා නිවැරදි විනිශ්චයත් මේ සැසිවාර සියල්ලේදීම අතිශයින්ම ප්‍රයෝජනවත් වූවාට සැකයක් නැහැ.

මෙම සම්මේලනයේ මහලේකම්තුමා අතින් ඉටුවූ සේවය පිළිබඳව ප්‍රසාදය පළ කිරීමට ලැබීම මා තුළ ඉමහත් සතුට දනවන කරුණක්. සාමය උදෙසා එතුමන් තුළ පවත්නා අචල කැපවීම හා ඒ දිනා ගැනීම සඳහා එතුමන් වෙහෙස නොබලා දරන උසස් ප්‍රයත්නය කා අතරත් ප්‍රකටයි.

ජනාධිපති කාර්යාලය
ග්‍රන්ථාලය

ජාත්‍යන්තර ජන සමූහයට අයත්ව සිටි අති උදාර නායකයින් කිහිප දෙනෙකුගේ අභාවය නිසා මේ වර්ෂයේදී ලෝකයට සිදු වූයේ බලවත් පාඩුවක්. යූගෝස්ලාවියාවේ ජෝශප් බ්‍රෝස් ටිටෝගේ අභාවය නිසා දෙවැනි ලෝක මහා සංග්‍රාම යුගයේ පතාක යෝධයන් අතුරින් අන්තිමයා අප අතරින් තුරන් කෙරුනා. දෙවැනි ලෝක මහා යුද්ධයෙන් පසුව ජාත්‍යන්තර සම්බන්ධතා දියුණු කිරීමෙහිලා ජනාධිපති ටිටෝ තරමටම වෙහෙස මහන්සිවූ ජගත් නායකයින් සිටියා නම් ඒ අතලොස්සක් පමණයි. නොබැඳි පිළිවෙතේ සමාරම්භක නායකයෙකු වශයෙන් ජනාධිපති බ්‍රෝස් ටිටෝ ශ්‍රී ලංකාවාසීන් සිහි කරන්නේ ඉමහත් සම්මානය හා ආදරය පෙරදැරි කරගෙනයි. අපේ ජනාධිපති ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන උතුමාණන් විසින් පවසන ලද පරිදි ඒ නොබැඳි පිළිවෙත, '' අපගේ දේශයේ විදේශ ප්‍රතිපත්තිය නමැති වස්ත්‍රයේ රන් හුයක්සේ දිවේ. ''

ජපානයේ ඔහිරා අගමැතිතුමාගේ අභාවය පිළිබඳව ජපානයේ ජනතාව සමග අපිද ශෝක වෙනවා. බොට්ස්වානා දේශයේ ආරම්භක ජනාධිපති සර් සෙරට්ස් කාමාගේ අභාවය ගැන ද අපි එම ජනතාව සමඟ තැවෙනවා. ජෝර්දාන ජනතාව සමග දුක් වෙනවා.

මේ සැසිවාරයේදී අපි අලුත් සාමාජික රාජ්‍ය දෙකක් සාදරයෙන් පිළිගන්නවා. ඒ දෙක නම සිම්බාබ්වේ සහ සෙන්ට් වින්සන්ට් හා ග්‍රෙනාඩීන්ස්ය. සිම්බාබ්වේ රාජ්‍යය සාදරයෙන් පිළිගැනීමේදී මගේ පෞද්ගලික සන්තුෂ්ටියකුත් ඒ හා සමඟ මුසු වෙනවා. සිම්බාබ්වේ රාජ්‍යයට ස්වාධීනත්වය ලැබීමට හේතුවූ තීරණාත්මක පියවර ගන්නා ලද්දේ ගිය වසරේ ලුසාකා නුවරදී පැවැත්වුණු පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුවේදීය. එයට සහභාගිවීමේ වරප්‍රසාදය මටත් ලැබුණා.

සිම්බාබ්වේ දේශයේ නිදහස උදෙසා අප විසින් කරන ලද සාකච්ඡා හා අප විසින් දෙන ලද අනුබලයන් සාර්ථක වී, ස්වාධීන දේශයක් වශයෙන් සිම්බාබ්වේ රාජ්‍යයට මේ ජගත් සමුළුවේදී අප හා එක්වන්නට ලැබීම අපට මහත් ප්‍රීතියට හේතුවක්.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය කාටත් සාධාරණ යැයි ද, ප්‍රමාණය, බලය, ජනගහනය හා තත්ත්වය පිළිබඳ තැකීමකින් තොරව සැම සාමාජික රාජ්‍යයක්ම එක සමානයැයි ද කියන මූලික ප්‍රතිපත්ති මේ රාජ්‍ය දෙක මෙම සංවිධානයේ සාමාජිකත්වයට බඳවා ගැනීම නිසා යළිත් ප්‍රදර්ශනය වුණා.

සභාපතිතුමනි, සම්භාවනීය නියෝජිතවරුනි, අපගේ ජනාධිපති ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්ගේ සම්මානය මේ සම්භාවනීය සම්මේලනයට පිරිනැමීමත්, එතුමාගේ සුබ පැතුම් මේ සැසි වාරය වෙනුවෙන් ප්‍රණාමය කිරීමත් මා ගෞරව පෙරටුව කරනවා.

සභාපතිතුමනි, ජාත්‍යන්තර තත්ත්වය පිරිහෙමින් පවත්නේදැයි කියන අදහස ලෝක නායකයන් වෙතින් පසුගිය මාස කිහිපය තුළ බහුල වශයෙන් ප්‍රකාශ වුණා. මේ අදහසට විරුද්ධවන කිසිවෙකු නැතැයි මා කල්පනා කරනවා. මත භේදයක් ඇතොත්. එය පවතින්නේ මේ පරිහානියට හේතු වූ කරුණු පිළිබඳවයි.

අපි නියැකවම, අන්තර් ජාතික සබඳතාවන්හි ප්‍රබල සන්ධිස්ථානයකට පත්ව සිටිනවා. මේ ශත වර්ෂයේ ලබන දශක දෙක තුළදී ජාත්‍යන්තර තත්ත්වය හැඩ ගැසෙනු ඇත්තේ අප කියන දෙයටත් වඩා අප කරන දෙයිනුයි. මිනිස් ඉතිහාසයේ වෙන අන් කිසිම කාලයකදී නොවූ තරමට අපි අද තීරණාත්මක මංසන්ධියකට එළඹ සිටිනවා. ඉන් එක් මගක් ඔස්සේ ගියහොත්, අපට මානව සංහතියට අසහාය බලාපොරොත්තු ඇති කොට ගතහැකි ලෝකයකට එළඹිය හැකි වෙනවා. අනික් මාර්ගය පරිහානියේ පාතාලයයි. ඒ මගින් ගියහොත්, අද අප අගය කරන මානව සාර ධර්ම සියල්ලම විනාශ වනු ඒකාන්තයි.

මේ අභියෝගයට අප මුහුන දෙන්නේ කොයි ආකාරයෙන් ද ?

මේ අභියෝගයේ ප්‍රමාණය අති විශාලයි. ප්‍රශ්නය ඉතා සංකීර්ණ හෙයින්, එයට පිළිතුරු සම්පාදනය කළ යුතු වන්නේත් අද අප සිටින තැන සිටමයි. ඒ ඒ ජාතීන් තනි තනිව වෙහෙසීමෙන් හෝ ජාතීන් කුඩා කණ්ඩායම්වලට බෙදීමෙන් හෝ මේ ප්‍රශ්න කිසිසේත් විසඳිය නොහැකියි. අවාසනාවකට මෙන් අප මේ අභියෝගයට ලෝක මට්ටමෙන් මුහුණ පෑ යුතුව තිබෙන සමයක දී, ඇතැම් රටවල් මේ ප්‍රශ්නවලට තනි තනිව විසඳුම් සොයන්නට යැරයීමේ ලකුණු බහුල වශයෙන් දක්නට තිබෙනවා.

ලෝකයේ ජන කණ්ඩායම් විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය නමැති මේ ජගත් සමුළුව පිහිටුවා ගන්නා ලද්දේ අවුරුදු තිස් පහකට පෙරදීයි. මානව සංහතියේ උදාර පරමාදර්ශ, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියෙන් නාමත් පිළිබිඹු වෙනවා. මෙ ප්‍රශ්න විසඳිය හැකි ආයතනයක් වන එක්සත් ජාතීන්ගේ සංවිධානය ගැන අද ඇතැමුන් තුළ සැක පහළවීම කම්පාවට හේතුවක්. අප අද මුහුණ පා සිටින අර්බුදකාරී තත්ත්වය නිසා සාමූහිකවත්, සහයෝගිතාවයෙන් යුතුවත්, ක්‍රියා කරන්නට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතන රටාව විසින් සලසා ඇති ක්‍රම හා උපක්‍රම ඔස්සේ නිසි අරමුණක් ඇතුව අර්ථවත් ලෙස ක්‍රියා කිරීමට අපට සිදුවී තිබෙනවා.

ඉන්දියානු සාගරය සාම කලාපයක් ලෙස ප්‍රකාශ කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශනය ක්‍රියාවෙ යොදවනු පිණිස ලබන වර්ෂයේදී මෙම සංවිධානයේ අනුග්‍රහය යටතේ පැවැත්වෙන ජාත්‍යන්තර සම්මේලනය

ආසියානුකරයේ අප විසින් සාදරයෙන් අනුමත කරනවා. ඉන්දියන් සාගරය සත්‍යවශයෙන්ම සාම කලාපයක් වන තැනට කටයුතු යෙදීම, ඉන්දියානු සාගර බද්ධ රාජ්‍යයන්ගේත් සෙසු රාජ්‍යයන්ගේත් සාමූහික ප්‍රයත්නයක් විය යුතුයි. අප මේ සාමය සොයා යන්නේ, සිය පුරවැසියන් සඳහා සෞභාග්‍ය සම්පන්න ආර්ථිකයක් ගොඩ නඟාලනු සඳහා සිය අවධානය යොමු කරවන්නටත්, සිය ශක්තිය එක් රැස්කොට ගන්නටත්, සිය සම්පත් උපයෝගී කොට ගන්නටත්, අපගේ මේ ප්‍රදේශයේ රාජ්‍යයන්ට අවස්ථාව ලබාදෙනු පිණිසයි.

සටටන, යුද්ධයට සැරසීම් සහ අවි එකතුව නිසා ඇතිවිය හැකි අයථා විකෘති කිරීම් අපට පිළිගත නොහැකියි. ජාත්‍යන්තර දේශපාලනයෙහි මූලධර්මයක් මේ ප්‍රකාශනයෙහි අන්තර්ගත වෙනවා. එනම්, රටවල අභ්‍යන්තර කටයුතුවලට අත නොගැසීමත්, බලය භාවිතය ප්‍රතික්ෂේප කිරීමත්.

ශ්‍රී ලංකාව ථෙරවාද බෞද්ධ මධ්‍යස්ථානයක් වශයෙන් චිර ප්‍රසිද්ධියක් උසුලනවා. බෞද්ධ දර්ශනයෙහි ඇතුළත් සනාතන සත්‍යයන්ගෙන් ඉතා වටනා සත්‍යය නම්, අවිහිංසාවයි. මේ අවිහිංසාවාදය නිසා බුදු දහම, ප්‍රබල ජාත්‍යන්තර බලවේගයක් බවට පත්වුණා. අවුරුදු 2500කටත් අධික දීර්ඝ ඉතිහාසය මුළුල්ලේ බුදු දහම ජාතීන් අතර සුහදතාව දියුණු කරන මඟක් වූයේත් ඒ අවිහිංසා පදනම නිසයි.

මෙයට ඉතාම හොඳ නිදර්ශනය සැපයෙන්නේ ධර්මාශෝක අධිරාජයාගේ ධර්ම විජයෙනුයි. ඒ අධිරාජයා ඉන් අදහස් කළේ රාජ්‍ය අතර සබඳතා එන්හිදී සාධුචර්යා පිළිබඳ පදනමක් පිහිටුවාලන්නටයි. ධර්මාශෝක අධිරාජයා බටහිර ආසියාවේ සහ දකුණු ආසියාවේත් පාලකයන් වෙත පෞද්ගලික ධර්මදූතයන් යැව්වා. සුහදබව පිළිබඳ සංදේශ රැගෙන ගිය ඔවුනු, චර්යාධර්ම උගැන්වූවා. ඒ ධර්මිෂ්ඨ චර්යාවන්හි පදනම වූයේ බුදු දහමයි.

ඒ අධිරාජයාගේ ප්‍රතිපත්තිය මානව ඉතිහාසයේ අසහාය ප්‍රයත්නයක්. ජාත්‍යන්තර සබඳතාවයනට සාධුචර්යාමය සංකල්පයන් ගෙන එන්නට පාලකයෙකු විසින් දරන ලද එකම ප්‍රයත්නය ලෙස එය හැඳින්වීමට පුළුවන්. ලෝක ප්‍රශ්න සහ ජාත්‍යන්තර සුහදතාවය පිළිබඳව මානව භක්තියෙන් හා සදාචාරාත්මක ඇසකින් නොබැලීම අපේ රටවල දක්නට ලැබෙන අඩුපාඩුවක්. අපගේ වර්තමාන අර්බුදයනට මූලත් මෙය විය හැකියි.

වනයේ රීතියෙන් නීතියේ රීතිය වෙත ගමන් කරන්නට මානව සමාජය අනාදිමත් කාලයක් මුළුල්ලේ සිට ප්‍රයත්න දරනවා. ඉන් ඉදිරියට යමින් ආදරයත්, අවිහිංසාවත් පදනම්කොටගෙන තැණුනු දයාදරිත රීතිය ක්‍රියාත්මක

වන ලෝක සමාජයක් යළි ගොඩනංවා ගැනීමට අපට වෙහෙස විය නොහැකිද ? දිවි පෙවෙතෙහි හැම මට්ටමකදීම – අපගේ පෞද්ගලික සබඳතාවන්හිදී මෙන්ම ජාතීන් අතර සබඳතාවන්හිදීත් මේ දයාවේ රීතිය අනුගමනය කරන්නට මෙතැන සිට ලොව සැමදෙනාටම ආදර්ශයක් දීමට අපට නොහැකිද ?

අප අයත්ව සිටින මේ අසහාය ජගත් සංවිධානයේ පරමාර්ථ නියම වශයෙන්ම මුදුන්පත්වන්නේ එවැනි ප්‍රයත්නයකින් යැයි මම සිතනවා.

අවි ගැටුම් හා එවැනි ගැටුම් පිළිබඳ තර්ජන නාමිත් මානව සංහතියට අනතුරක් ව පවතිනවා. ජාත්‍යන්තර තත්ත්වයෙහි ගිනි ඇවිලෙන තැන් බොහෝයි. එවැන් තැන් එසේම තිබෙන්නට හැරීම නිසාත්, අලුතින් ගිනි ඇවිලෙන තැන්වලට පිදුරු දැමීම නිසාත් නරුම්වාදයත්, නොසැළිකිලි බවත් පිළිබඳ අන්තරායදායි මනයක් ඇතිවීමට ඉඩ තිබෙනවා. එවැනි මනය නිසා බලය පාවිච්චි කිරීමට පෙළඹෙනවා. එමෙන්ම, බලය භාවිත නොකොට බැරියයි කියන දරුණු හැඟීමද ඉස්මතුවෙනවා.

නීතිය අනුව හැසිරෙන, නීති ගරුක අය තුළ එක්තරා කළකිරීමකුත් හටගැනී තිබෙනවා. නීති ගරුක අයට වඩා ලෝකයේ ජයගන්නේ නීතිය නොතකන නොදැමුණු අයයැයි ඔවුහු සිතනවා. වැරදි ක්‍රියාවල යෙදී සිටින අය දියුණුවෙද්දී නීතිය සලකන ගුණ ගරුකයන් වධවේදනා විඳින හැටි අපි බොහෝවිට දැක තිබෙනවා. සාමාන්‍ය සමාජයේදී මෙන්ම, ජාත්‍යන්තර සබඳතාවන්හිදී ද එය එසේම බවයි පෙනෙන්නේ. තමා කියන දේ ඇසෙනු පිණිස කෙනෙකු මුරගෑ යුතුද ? සැළකිලි ලබනු පිණිස බිය ඉපදවිය යුතුද ? ආධාර ලබාගනු පිණිස තර්ජනය කළ යුතුද ? ප්‍රජාතන්ත්‍රවාදය හා මානව අයිතිවාසිකම් ඉබේ ලැබෙයැයි සිතිය යුතුද ? ජය ගැනීමේ එකම රහස බලය සහ බලයේ තර්ජනය පමණක් ද ? අද ලෝකය එවැනි නරුම්වාදී මානසික තත්ත්වයකට ඉතා කිට්ටු සේ පේනවා.

රට රටවල් අතර ප්‍රශ්න විසඳා ගැනීමේදී අවි ආයුධ වලින් තොර වාග් සංග්‍රාමයක් ගැන තොරතෝංචියක් නැතිව කථා කළත්, අවි ගැටුම් සඳහා යුද්ධාධාර සපයන්නට ඉදිරිපත්වන අය බොහෝයි. අපගේ සාම කලාපය පමණක් නොවෙයි, අප විසින් ඉතා දැඩි ලෙසත්, ස්ථිර සාර ලෙසත් උත්සාහ දැරිය යුත්තේ ලෝකය පුරා පමණක් නොව මිනිසුන්ගේ සිත් සතන් තුළත් දහස් ගණන් සාම කලාප ඇතිකරන්නයි.

නොබැඳි පිළිවෙතේ සමාරම්භක රටක් වශයෙන්, ශ්‍රී ලංකාව ඒ ගැන ආඩම්බරවන අතර, එම ව්‍යායාමය විසින් ඉටු කළ යුතු මෙහෙවර ඉතා භාරදූර සේ සළකනවා. මේ ජගත් සමුළුවේ සාමාජික රාජ්‍ය 154න් 94ක්ම

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

විසින් නොබැඳි පිළිවෙතේ මූලධර්ම අනුමත කරනවා. තවත් බොහෝ ජාතීහු නිරීක්ෂකයන් හා ආගන්තුකයන් වශයෙන් නොබැඳි පිළිවෙතේ අරමුණු හා බලාපොරොත්තු කෙරේ අනුකූලතාව දක්වනවා.

ජගත් ජන කණ්ඩායම සාමූහිකව පෙරට ගෙනයන ව්‍යාපාරයන්හි යෙදෙන්නට අප මෙහෙයවන සබඳතා රටා කිහිපයක් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ තිබෙනවා. ඉන් බොහොමයක්ම තිබෙන්නේ ආර්ථික සම්බන්ධතා යැයි නම් කරනු ලබන අංශය තුළයි.

නිදර්ශනයක් මෙසේය : ලෝකයේ ආර්ථික නිෂ්පාදනයෙන් වඩාත් විශාල කොටසක් – සියයට 25ක් තරම කොටසක් – සංවර්ධනය වෙගෙන එන දේශයන්ට ක්‍රිස්තු වර්ෂ 2000 දී ලැබිය යුතුයැයි ප්‍රකාශන කිහිපයක් ඉදිරිපත් කොට තිබෙනවා. ඒ අතරම, සංවර්ධනයවූ රටවල් විසින් ආර්ථික ක්ෂේත්‍රයෙහි ආරක්ෂක පවුරු තනාගනු අපට පේනවා ! මේ නිෂ්පාදිත ද්‍රව්‍ය අලෙවි කළහැකි වෙළඳ පොලවල් ලබාගැනීමට සංවර්ධනය වෙමින් පවතින රටවල් දරන ප්‍රයත්නයට ලොකු බාධාවක්.

අරමුණ හා ඒ අරමුණ දිනාගැනීමත් අතර තිබෙන පරතරය සෙසු ක්ෂේත්‍ර වලදීත් බොහෝ ලෙස කැපී පෙනෙනවා. 1970 දශකයේ ආරම්භයේ මේ සංවිධානයේදී නිලවශයෙන් ප්‍රකාශකොට සිටියේ සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකය පුනරුත්ථාපනයට පත් කිරීමට නම්, සහනදායි ආධාර දීමනා – නිල වශයෙන් සැපයෙන සංවර්ධනාධාර—දියුණු රාජ්‍යයන්හි දළ ජාතික නිෂ්පාදනයෙන්, යටත් පිරිසෙයින් සියයට 0·77ක් වත් විය යුතු බවයි. එහෙත්, දශකයේ අග වනවිට දී දී තිබූ නියම ආධාර ප්‍රමාණය වූයේ ඉන් අඩක් පමණයි. එනම් දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 0·35යි.

දියුණු රාජ්‍යයන්ට අද මුහුණ පාන්නට සිදුවී තිබෙන කෙමෙන් අධිකවන ධන පරිහානිය අනුව සළකා බලන කල්හි අනාගත බලාපොරොත්තු මීටත් වඩා අඳුරුයි. මේ නිදර්ශන දෙකෙන් පැහැදිලි වන පරිදි අභිප්‍රායත්, ඒ අභිප්‍රාය මුදුන්පත් කිරීමේ ක්‍රියාදමයත් අතර ඇත්තේ විශාල පරතරයක්. අප එකිනෙකාගේ අවශ්‍යතාවයන් පොදුවේ ගෙන සළකා බලා, සාමූහික ප්‍රයත්නයකින් ඒ වියදා නොගෙන, ඒ ප්‍රශ්නය ගැන තමන්ට වාසිදයක පැත්තකින් පමණක් බලා කටයුතු කරන්නට යෑම මීට ප්‍රධාන හේතුවයි.

ආරක්ෂිත පවුරු තැනීමේදී යහ දියුණු වන රටවලට ආධාර සැපයීමේදී ද නිසි තත්ත්වය දූන් පැහැදිලිව පේනවා. උතුරේ දියුණු රාජ්‍ය නොදියුණු රාජ්‍යයන්ට පනවන වෙළඳ තහංචි ඉවත් කළහොත්, තුන්වන ලෝකයේ රැකිරක්ෂා විරහිත අයගේ ගණන අඩුවනවා පමණක් නොවෙයි, ඒ හේතුව නිසාම උතුරු–දකුණු වෙළඳ ගනු–දෙනු වැඩි වර්ධනය වී උතුරේ

රැකිරක්ෂා සංඛ්‍යාව පවා අධික වෙන බව පැහැදිලි ලෙස පෙන්වා දී තිබෙනවා. අදූරදර්ශී ප්‍රතිපත්ති අත්හැර දැමීම දියුණු රාජ්‍යවල ආත්මාර්ථය සඳහාත් අවශ්‍ය වෙනවා.

සංවර්ධනය වෙමින් පවතින රටවලට යහපතක් සැලසෙන පරිදි ලෝකයේ කර්මාන්ත අලුතින් බෙදා වෙන්කරගත යුතුය යන අදහස පහසුවෙන් පිළිගනු ලැබෙතැයි සිතිය නොහැකියි. ජගත් ආර්ථික රටාව අනුව, සංවර්ධනය වූ රාජ්‍යයන්හි පිහිටුවා ඇති කර්මාන්ත බොහොමයකින් අද ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් නැති බවට පත්ව තිබීම යථාර්ථයක්.

නොදියුණු රාජ්‍යයන් සිය අපනයන ද්‍රව්‍යවලින් ලැබෙන ආදායම් දියුණු කොට ගන්නා පිණිස එකට එකතුවන්නට ප්‍රයත්න දරනවිට, ඒ රාජ්‍ය පොදු යහපතට පටහැනි මං ගනිතැයි ඒවා දෝෂ දර්ශනයට ලක් වෙනවා. මේ තත්ත්වය සාධාරණදැයි මම අසන්නට කැමතියි. අප මෙවැනි වූ ප්‍රතිවිරුද්ධ උපක්‍රම මගින් එකිනෙකාට පටහැනිව ක්‍රියා කිරීම අවශ්‍ය ද ?

නිල වශයෙන් සැපයෙන සංවර්ධනාධාර පිළිබඳ ප්‍රශ්නය ද ඉතා පැහැදිලියි. සිය ආර්ථිකය යළි ගොඩනංවා ගනු පිණිස දිළිඳු රාජ්‍ය දියුණුවනවිට ඔවුන් විසින් පිටරටින් ආනයන කරනු ලබන ද්‍රව්‍ය ප්‍රමාණය අධික වී ඉන් දියුණු රටවලට සැලසෙන සෙත ද අධික වෙනවා. එහෙත් මෙහිලා ඉතා අවාසනාවන්ත කරුණ නම්, මිලමුදල් ආධාර අත්‍යාවශ්‍යව තිබෙන මේ කාලයේදී, දියුණු රාජ්‍ය, උද්ධමනය පාලනය කොට ගැනීම සඳහා ව්‍යාපාර සඳහා මුදල් වැය කිරීම අඩු කිරීමේ අවශ්‍යතාවය ගැන කතා කිරීමයි.

එවැනි අඩුකිරීම් නිල වශයෙන් සැපයෙන සංවර්ධන ආධාර කෙරෙහි බලනොපානු ඇතැයි මම විශ්වාස කරනවා, දියුණු රාජ්‍යයන්හි, ව්‍යාපාර සඳහා ධනය වැයකිරීම අඩුකළ යුතුම නම්, එවැනි අඩුකිරීම්වලදී විදේශාධාර කෙරෙහි ඒ තදින් බලපාන අන්දමින් ක්‍රියා නොකරන ලෙස අපි ඉල්ලා සිටිනවා.

ආධාර දීමේදී ආධාර ලබන්නවුන් කෙරෙහි ඇතිවිය යුතු දයාවන්ත භාවය පමණක් නොව, තම තමන්ගේ ප්‍රයෝජනය සඳහා ද ආධාර දෙන්නවුන් ඒ සඳහා පෙළඹිය යුතුව තිබෙනවා. ලෝක ආර්ථිකය කොයි තරමට අන්‍යෝන්‍යාධාර මත රඳා සිටින්නේද කිවහොත්, දිළිඳු රාජ්‍ය පසුබැවොත්, ඒ රාජ්‍යයන් විසින් ඉසුරුමත් රාජ්‍යයන්ගෙන් ද්‍රව්‍ය මිලයට ගත නොහැකි තත්ත්වයක් ඇතිවෙනව. දිළිඳු රාජ්‍යවලින් බොහොමයක් තමන්ගේ දිළිඳුකම ඉවසමින් ජීවත්වන්නට පුරුදුවී සිටියත්, අන්තිමේදී ඒ දිළිඳු රාජ්‍යයන්හි දිළිඳුකම විසින් ධනවත් රාජ්‍යයන් අනිවාර්යයෙන්ම පහතට ඇද දමනු නියතයි.

දිගින් දිගටම සිදුවන තවත් පරස්පර විරෝධිතාවයක් පෙන්වා දීමට පුළුවන්. එනම්, සංවර්ධිත රටවලින් ප්‍රදානය කරනු ලබන ආධාර දීමනා අඩු කෙරෙද්දී යුද්ධාරක්ෂක කටයුතු සඳහා වියදම් වැඩිකිරීමයි. තුන්වන ලෝකයේ පවත්නා දිළිඳුකම උග්‍රවෙද්දී, අද ලෝකයේ දියුණු රාජ්‍යයන් විසින් යුද්ධායුධ සඳහා වැය කරන ඇමරිකානු ඩොලර් කෝටි 4,50,000කට කිට්ටු මුදල් ප්‍රමාණයත්, නිල වශයෙන් සැපයෙන සංවර්ධනාධාර ප්‍රමාණය වන ඇමරිකානු ඩොලර් කෝටි 2,000 ක් මුදලත් අතර වෙනස හඳුන්වාදිය හැක්කේ ඉතා කම්පාදායක ක්‍රියාදාමයක් ලෙසිනුයි.

මින් හැඟෙන්නේ මිල මුදල් පමණක් නොවේ. විද්‍යාඥයින්, ඉංජිනේරුවරු ආදීන්ගෙන් නැගෙන මිනිස් ශ්‍රම බලය වැනි නියම සම්පත් ද නවීන තාක්ෂණිකඥනයෙන් වැඩි ප්‍රමාණයක් ද මීට ඇතුළත් වීමයි. අඩු සංවර්ධිත රටවල ප්‍රයෝජනය පිණිස මෙම සම්පත් යොදවා ඒ රටවල් නඟා සිටුවීමට හැකිකම තිබෙද්දී මෙසේවීම වඩාත් කණගාටුදායකයි.

ජාතිකාදායමෙන් සියයට තුනකටත් අඩු ප්‍රමාණයක් රාජ්‍යාරක්ෂක කටයුතු සඳහා වැය කරන දේශයක් වෙනුවෙන් කථා කරන ම විසින් පැවසිය යුතු කරුණක් ඇත. එනම්, යුද්ධායුද සඳහා බහුල වශයෙන් ධනය වැය කළ යුතු යැයි ඉතා දිළිඳු රාජ්‍යයන් පවා සිතන තරමට, යුද අවි දෙළඳුක ව්‍යාප්ත වී තිබෙන බවයි.

සම්පත් බෙදදීම වැරදි ලෙස සිදුවන අවස්ථාවක් හැටියට පෙන්වාදිය හැකි නිදර්ශනයක් තිබෙනවා. ඇතැම් විටෙක ආධාරවල මුවාවෙන් යම් යම් රටවල් තවත් රටවල්වලට සපයනු ලබන්නේ යුද්ධායුදයි.

යුද්ධායුධ හෝ යුද්ධාරක්ෂක කටයුතු සඳහා වැය කෙරෙන ධනයෙන් සැලසෙන ජාත්‍යන්තර ආරක්ෂාව, දිළිඳු රාජ්‍යවලට ආධාර වශයෙන් වැය කෙරෙන ධනයෙන් සිදුවන ආරක්ෂාවට වඩා වැඩිදැයි යන්න මේ කරුණු පිළිබඳව ඉතා සූක්ෂම ලෙස කල්පනා කිරීමෙදී මතුවන ප්‍රශ්නයක්.

ක්‍රිස්තියානි, හින්දු, ඉස්ලාම් හා බුදු සමය වැනි ලෝක ආගම් යුද්ධයේත් බලකාමයේත් අනුවන කම පෙන්වාදී තිබියදීත් ලෝක ජාතීන් අවිබලය තව තවත් තර කර ගැනීමට දිගින් දිගටම ප්‍රයත්න දරන්නේ ඇයි? බුද්ධ භාෂිතය අන්තර්ගත ධම්ම පදය මේ උභතෝකෝටික ප්‍රශ්නයේ හරය දක්වන්නේ මෙහෙමයි ;

තණ්හාය ජායති සොකො — තණ්හාය ජායති භයං

තණ්හාය විප්ප මුත්තස්ස — නත්ථි සොකො කුතො භයං

තණ්හාව ශෝකය උපදවයි. තණ්හාව භය උපදවයි. තණ්හාවෙන් මිදුන කල ශෝකයක් නැත ; භයක් නැත.

යාමය සොයා යන ගමනේදීත් යුද්ධයට විරුද්ධව ගෙනයන සංග්‍රාමයේදීත් අප විසින් ශ්‍රේෂ්ඨ ආගම් මගින් දේශනා කළ උපදේශයන්ට නැඹුරුවීම ඉතා ප්‍රයෝජනවත්. අපට බියෙන් මිදිය හැක්කේ එවිටයි.

ළඟ ළඟම එන ආර්ථික පසුබැස්ම නියා ද්විපාක්ෂික ආධාර දීමනා අඩු වෙමින් යන්නට ඉඩ තිබෙන හෙයින්, ජගත් සංවර්ධන අරමුදල වැනි බහු පාක්ෂික ආධාරායතනයක අගය ඉස්මතුවී පෙනෙනවා. තෙල් නිපදවන රටවල සංවිධානය—නැතිනම් ඔපෙක් සංවිධානය මගින් උපයන අතිරේක ආර්ථික සම්පත් නොදියුණු දේශයන්ට ආධාර මුදල් සපයනු පිණිස ආපසු යැවීමෙ වැඩපිළිවෙල මෑතකදී පැහැදිලි කරදී තිබෙනවා.

එවැනි සංවර්ධන අරමුදලක් නොපමාව පිහිටුවනු ඇතැයි ද ඒ දිළිඳු රටවල ආර්ථිකය පුනරුත්ථාපනය කරන නවත් ප්‍රාග්ධන අරමුදලක් වනු ඇතැයි ද යනු අපගේ විශ්වාසයයි.

මේ විෂය ගැන කතා කරද්දී, ම විසින් එක ඉල්ලීමක් කළ යුතුයි. එනම් බහු පාක්ෂික සංවර්ධන ආයතන විසින් පනවනු ලබන දිනපතා වැඩිවෙමින් පවතින දැඩි නීතිරීති හා කොන්දේසි, යළිත් විමසා බැලිය යුතු බවයි. මෙම නීතිරීති පැනවීමේදී එද තුබූ තත්ත්වයට වඩා වෙනස් තත්ත්වයක් ලෝකය පුරා—විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල පැනනැගී තිබීම මීට හේතුවයි. වඩාත් ක්‍රමවත් ජාත්‍යන්තර ආර්ථික රටාවක් උදෙසා සකස් කරන ලද මෙම නීති රීති අද මේ යුගයේ පවතින සංකීර්ණ තත්ත්වයට ගැලපෙන පරිදි වෙනස් කිරීම අත්‍යාවශ්‍යයි.

අන්තර් ජාතික ආර්ථික සහයෝගය සහ සංවර්ධනය යඳහා කැපවූ විශේෂ යැසිවාරය දැන් නිම කළා විතරයි. නව ඉදිරියට අප විසින් විශාල කාර්ය භාරයක් ඉටුකළයුතු ක්ෂෙත්‍ර ගණනාවක් ද අප විසින් තෝරාගෙන තිබෙනවා. පළල් සහයෝගිතා පදනමක් මත කරනු ලබන සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් ඉමහත් ඵල ප්‍රයෝජන ලැබෙයයි යන මා තුළ ඇති අදහස මට ලොකු ධෛර්යයක් ගෙනදෙනවා.

අප දේශන හා ක්‍රමෝපාය ගැන පමණක් සිත යොමුකොට සිටිය යුතු නැහැ. අප අතර ඇතිවන සුහද සාකච්ඡාවල ඇති විපුල ඵල ප්‍රයෝජන ගැන ඔබේ අවධානය යොමු කිරීමට මා කැමතියි. ලෝකයේ නියි සංවර්ධනයක් ඇති කිරීමෙහිලා මෙතෙක් යොදගත් සංවර්ධන උපක්‍රම මගින් එතරම් ඵලප්‍රයෝජනයක් නොවීම අභාග්‍යයක්.

ලෝක ව්‍යාප්ත යුද්ධයක අවාසනාවන්ත තර්ජනයෙන් බේරී සිටීමට පසුගිය තිස්පස්වස තුළ අපි වාසනාවන්ත වුණා. එහෙත් මනුෂ්‍ය සංහතියට දුක් පීඩා පමුණුවන, මිනිස් කමට නිගා දෙවන, දුගී දුප්පත්කම නමැති බලගතු තර්ජනයෙන් ගැලවීමට අපට හැකිවුනේ නැහැ.

ජගත් මට්ටමෙන් සලකා බලන විට පැහැදිලිවන කරුණක් නම් පොහොසත් හා දිළිඳු රටවල පරතරයත්, උතුරු-දකුණු දේශ අතර පරතර යත් එක හා සමාන පළල් ප්‍රමාණයකින් පවතින බවයි. උතුරුකරයේ ජීවත්වන ලෝක ජනගහනයෙන් හතරෙන් පංගුවක් වන ජනතාව ලෝක ආදයමෙන් හතරෙන් තුන් පංගුවක් භුක්ති විඳිනවා. මේ අතර දකුණුකරයේ වසන ලෝක ජනගහනයෙන් හතරෙන් තුනක් පමණ වූ ජනතාවට භුක්ති විඳීමට ඇත්තේ ලෝක ආදයමේ ඉතිරි හතරෙන් එකක සුළු කොටස පමණයි.

ලෝක ආදයම ලෝ වැසියන් අතර බෙදහද ගැනීමේදී දක්නට ලැබෙන විෂමතාවය පිළිබඳව මා පෙර දැක්වූ නිදර්ශනයෙන් සම්පත් භාවිතයේ විෂමතාවයත්, දිළිඳුකම පිළිබඳ අර්බුදයේ ගැඹුරත් ඉතා පැහැදිලි ලෙස පෙනියයි. මෙ විෂමතාවය අඩු කරන්නටත්, මිනිස් ජාතියට මුහුණපෑමට සිදුවී ඇති එම තර්ජනය ඉවත්කිරීමටත් ජගත් ජන කණ්ඩායම විසින් විවිධ ප්‍රයත්නයන්හි යෙදී සිටිනවා.

ජාත්‍යන්තර සංවර්ධන ප්‍රශ්න පිළිබඳව සොයාබලා වාර්තා කිරිමෙ ස්වාධීන කොමිෂමක් ඉතා මෑතකදි පත්කරනු ලැබුවා. මෙය ප්‍රසිද්ධවූයේ බ්‍රාන්ට් කොමිෂම යන නමිනුයි. බ්‍රාන්ට් කොමිෂමට වසර එකොළහකට පෙර පියර්සන් කොමිෂම පත්කරනු ලැබුවා. අභාවප්‍රාප්ත ලෙස්ටර් පියර්සන්ගේ නායකත්වය යටතේ පැවති ජාත්‍යන්තර සංවර්ධන කොමිෂම මගින්, ප්‍රකාශයට පත්කළ ඇතැම් වගන්ති සිහිපත් කිරීම මේ අවස්ථාවේදි වැදගත් වෙනවා.

ඔහු මෙසේ කිවා ; ''ජාත්‍යන්තර සංවර්ධනය වූකලී අප වෙසෙන මේ යුගයේ ඉතා බලවත්ම අභියෝගයයි. අන්‍යෝන්‍යාධාරයෙන් විසිම යන්නෙන් ඇඟෙන්නේ කුමක්දැයි අප තේරුම්ගෙන සිටින්නේදැයි ඒ අභියෝගයට අප මුහුණපාන ආකාරයෙන් පැහැදිලිවේ. මානව සංහතියේ බහුතර පක්ෂයක දිළිඳුකම හා අගහිගකම් අමතක කිරීමෙන් ලොව වෙසෙන අප සියලුදෙනාටම මුහුණ පාන්නට වන දූශි බෙදවාවකය මුළාවෙන් අමතක කිරීමට යත්න දැරීම තරම බෙදවාවකයක් තවත් තිබේද? ''

බ්‍රාන්ට් කොමිෂම විසින් ද ඉතා පැහැදිලි ස්වරූපයෙන් අන්‍යෝන්‍යාධාරයේ අගය ඉස්මතුකොට දැක්වූවා. බ්‍රාන්ට් කොමිෂමත් සංවර්ධනයේ සාධුවර්යා පක්ෂය ගැන අතික් කොමිෂම තරම්ම සිත යොමු කළා. බ්‍රාන්ට් කොමිෂම විසින් වර්තමානයටත් අනාගතයටත් බලපාන පරිදි කරන ලද යෝජනා සහ ඉදිරිපත් කළ වැඩපිළිවෙලවල් ඉතා වැදගත්. මෙම වටිනා වාර්තාව පිළිබඳව ජගත් ජන කණ්ඩායම දැක්වූ උනන්දුව සහ සැළකිල්ල කාගේත් කනස්සල්ලට හේතු වෙනවා. ඒ වාර්තා සාකච්ඡා වලට හා කතාබහට මුල්වනු වෙනුවට මීට පෙරවූ එවැනි වාර්තා සමගම හමස් පෙට්ටියට යැවීමේ අන්තරායට භාජනවී තිබෙනවා.

යමකිසි ක්‍රියාමාර්ගයක් හෝ උපක්‍රමයක් ගැන යෝජනා කළ කල්හි, ඒවා ක්‍රියාවේ යෙදවීම කල් තබනු පිණිස අසීමිත හේතු රාශියක් ඉදිරිපත් වනු දක්නට තිබෙනවා. එක්කෝ ඒවා ක්‍රියාත්මක කිරීමට සුදුසු කාලය නොවේ යැයි සමහරු පවසනවා. නොඑසේනම්, ඒ සැලැස්මේ පරිමාණය අඩුකළ යුතුයයි සමහරුන් විසින් යෝජනා කරනු ලබනවා. හේතුව කුමක් වුවත් අපට දකින්නට හා අසන්නට ලැබෙන ප්‍රතිවිපාක නම් එම යෝජනා ක්‍රියාත්මක නොවීමයි.

නොදියුණු දේශයන්හි වෙසෙන අපි ලෝකයෙන් පුණ්‍යාධාර ඉල්ලා සිටින්නේ නැහැ. පුණ්‍යාධාර මගින් රටවල දිළිඳුබව තුරන් කළ හැකියැයි අපි විශ්වාස කරන්නේත් නැහැ. දුගී දුප්පත් කම තුරන් කළ හැක්කේ සූරාකෑම මුලිනුපුටා දැමීමෙන් පමණයි. හැම මිනිසෙක්ම, හැම දේශයක්ම සමාන අඩිතාලමක තැබීම කරන්නට බැහැ. එහෙත් හැම රටකටත්, හැම දෙනාටත් සමාන අවස්ථා සලසා දිය හැකියි.

දිළිඳු බවට තුඩු දෙන සූරා කෑම අද ජාත්‍යන්තර ආර්ථික සබඳතා රටාවේ අන්තර්ගතව පවතිනවා. ඒ රටාව වෙනස් කළ යුත්තේ ඒ නිසයි. නව අන්තර්ජාතික ආර්ථික ක්‍රියාදාමයක අවශ්‍යතාවය ගැන අප කතා කරනුයේ අන්න ඒ හේතුව නිසයි. එය මානව අයිතිවාසිකම්වලට ගරු කෙරෙන ක්‍රියාදාමයක් විය යුතුයි. එය ආර්ථික විෂමතා සහ දිළිඳුකම ඉවත්කිරීමට ඉවහල් විය යුතුයි. මන්දපෝෂණය සහ නූගත්කම බැහැර කිරීමට ඒ මගින් පිළියම් යෙදිය යුතුයි.

මා කතාකරන්නේ ජාතීන් සහ ජාතීන් අතර පමණක් පැවතිය යුතු නව ක්‍රියාදාමයක් ගැන නොවේ. අප විසින් මේ නව ක්‍රියාපරිපාටිය අපගේ රටවලත් පිහිටුවාලිය යුතුයි. අපි යාමකාමී නොවී ලෝක සාමය ගැන බලාපොරොත්තු නොවිය යුතුයි. අපේම රටේ, අපේම සමාජයේ, අපේම පවුල තුළ කොටින් කියතොත් අප තුළම සාමය ඇතිකර නොගතහොත් අපට ලෝක සාමයක් ඇති කළ නොහැකියි.

සෙස්සන්ගෙන් ආත්ම දමනය බලාපොරොත්තු වන්නට පෙර අපි ආත්ම දමනයෙන් යුක්තවිය යුතුයි. අනුන් සූරාකෑමේ පැරණි ආර්ථික ක්‍රියාදාමයක් අපගේ දේශයෙහි තිබෙන්නට හරිමින් නව අන්තර් ජාතික ආර්ථික ක්‍රියා පිළිවෙළක් සෙසු දේශයන්හි ඇතිකර ගන්නට බැහැ. සෙසු දේශාන්තරයන්හි සූරාකෑම් සහ විෂමතා නැතිකළ යුතුයයි උද්ඝෝෂනය කරන ගමන්ම අපගේ දේශය තුළ ආර්ථික පීඩන සහ ආර්ථික විෂමතා වැඩෙන තත්ත්වයක් ඇතිවන්නට ඉඩ නොදිය යුතුයි:

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මානව සංහතිය දූරාකෑම වලින් මුදවා ගැනීම ජාත්‍යාන්තර මට්ටමෙන් මෙන්ම ජාතික මට්ටමෙන් ද සිදුවිය යුතුයි. ජාතීන් අතර පවත්නා වෙනස්කම් හා විෂමතා එකිනෙකට යාවී තිබෙනවා. එය උතුරට මෙන්ම දකුණට ද පොදුයි. වීදුරු ගෙවල් බොහෝයි. අපි මේ ගෙවල් වෙනස් කරමු. ඒ අතර ඒවාට ගල්ගැසීමෙන් ද වැළකී සිටිමු.

සභාපතිතුමනි, ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් තීරණයක් ගැනීමේදී හැකිතාක් මහජනයා හවුල්කොට ගැනීමේ අවශ්‍යතාවය ගැන මා සිත නිතරම ඇදී යන්නේ ඒ නිසයි. දිළිඳුකමට පටගැනිව කෙරෙන ලෝකව්‍යාප්ත සටනෙහි මූලිකාංගයක් වශයෙන් මා දකින්නේ අවශ්‍ය ප්‍රමාණයට නිවාස සම්පාදනයයි. තදබදය, සෞඛ්‍ය සංරක්ෂණයට ඇති හානිය, ආරක්ෂාව නැතිකම යන අර්බුද ඉවත් කළ යුතුවෙයි. අපගේ ජනතාව වෙසෙන පරිසරය ඔවුන්ට යැනසුම් දායක ලෙස නිර්මානය කිරීමේදී නිවාස සම්පාදනයට ලැබිය යුත්තේ ප්‍රධාන තැනකි.

සංවර්ධනය කඩිනම් කිරීමේදී නගර සංවර්ධනය ද ක්‍රමවත්ව සකස් නොවූව හොත් නාගරික පරිසරය දූෂණය වී මුඩුක්කු හා පැල්පත් වැඩිවනු ඒකාන්තයි. ඒ අතර නගර කරා ඇදෙන ග්‍රාමීය ජනතාව ද වැඩිවනු ඇති. නගරයේ තදබදය, අපවිත්‍රතාවය හා දිළිඳුකම වැඩිවෙයි. මෙ සංවර්ධනය වෙමින් පවතින ඕනෑම රටක දක්නට ලැබෙන දෙයක්.

නොදියුණු දේශයන්හි වෙසෙන අපගේ ජනයාගෙන් සියයට විස්සක් පමණ ඉතා ඇඩි මන්දපෝෂණයෙන් පෙළෙන බව වාර්තා වෙනවා. සියයට පනහකට හොඳ පවිත්‍ර ජලය ලැබෙන්නේ නැහැ. සියයට හැටකට නියම සෞඛ්‍ය සංරක්ෂණයක් නැහැ. දරුවන්ගෙන් සියයට විස්සක්ම පස්වන වියට එළඹෙන්නට පෙර මරණයට ගොදුරු වෙනවා.

රැකීරක්ෂා විරහිත භාවය, අධ්‍යාපනය සහ සෙසු මූලික අවශ්‍යතා පිළිබඳවත් ලැබෙන සංඛ්‍යාලේඛණ කණගාටුදායකයි. අපි සියලු දෙනාම අප අපට හැකි ආකාරයට මෙ ප්‍රබල ප්‍රශ්න විසඳන්නට ප්‍රයත්න දැරිය යුතුයි. මේ අඩුපාඩු බොහොමයකට විසඳුම රැඳී ඇත්තේ හොඳ නිවාස සම්පාදන යෙහිය.

නිවාස ප්‍රශ්න හුදෙක් ශ්‍රී ලංකාවට පමණක් සීමාවූවක් නොවේ. එය ආසියාවට පමණක් විශේෂ වූ ප්‍රශ්නයකුත් නොවෙයි. එය මුළු මහත් ලෝකයටම බලපාන ප්‍රශ්නයක්.

නිවාස නැති අයට නිවාස සම්පාදනය කිරීමේ අරමුණට කැපවූ ජාත්‍යන්තර වර්ෂයක් ප්‍රකාශයට පත් කරන්නැයි මම ඒ නිසා ඉල්ලා සිටිනවා. ඒ වර්ෂයේ විශේෂ අරමුණ පැල්පත් වාසීන් පුනරුත්ථාපනයට පත් කිරීම විය හැකියි. පැල්පත් වෙනුවට හොඳ නිවාස සම්පාදනය කිරීමේ කාර්යයට සංවර්ධන කටයුතු වලදී ප්‍රධාන තැනක් ලැබිය යුතුයි. නිවාස සම්පාදනය වෙනුවෙන් දරණ ප්‍රයත්නය මානව සංහතියේ සමෘධිය සඳහා කරන උදාර ආයෝජනයකි.

සභාපතිතුමනි, සම්භාවනීය නියෝජිතවරුනි, ලබන වර්ෂ කිහිපය තුළදී ලෝකය විසින් මුහුණ දී නිරාකරණය කළ යුතු ඇතැම් ප්‍රශ්න ගැන මම තමුන්නාන්සේලාගේ සිත් යොමු කළා. ඒ යන්තමින් විය හැකියි. අසූවේ දශකයේ එළිපත්ත වෙතට එළඹ සිටින අප සතු යුතුකම නම්, අප මුහුණපාන ප්‍රශ්නවලට සර්ව සම්පූර්ණ ලෙයත් සාධුවත් විසඳුම් සෙවීමයි.

ඔවුනොවුන් අතර සහයෝගය මෙන්ම ගැටුම් ද මානව ඉතිහාසයේ අංශයක් බවට පත්ව තිබෙනවා. අතීත යුගයන්හිදී එබඳු ගැටුම්වලට තුඩු දුන්නේ පටු, ප්‍රාදේශික ප්‍රශ්නයි. භාෂා, ජාති හා ආගම් විසින් මිනිසා බෙදනු ලැබුවා. ඒවායේ නාමයෙන් මිනිසුන් සටන් කළා. මරණයට පත්වුනා. අභාග්‍යයකට මෙන් මිනිසා විසින් නිර්මානය කළ ඒ විවිධ භෙද හේතුකොට ගෙන අදත් මිනිසා හා මිනිසා අතර බෙදීම් පවතිනවා.

විවිධ සංකල්පනා සහ වාදයන්ට වහල්ව ඒවායේ එල්බ සිටීම නිසා මිනිසුන් අතර ගැටුම් ඇතිවී තිබෙනවා. මේ අතර නැගෙනහිර සහ බටහිර අතර පවත්නා මතිමතාන්තර ගැන ද අපි දීර්ඝ කාලයක් වාද විවාද කර තිබෙනවා.

අද ලෝකය පෙළන උපද්‍රවයන්ගෙන් රෝග ලක්ෂණ වන උද්ධමනය, වෙළඳ අවාසි, මිළමුදල් ක්‍රම, ස්ථාවර ආහාර සම්පාදනය, වෙළඳ ද්‍රව්‍ය පිළිබඳ අර්බුදය වැනි දේවල් විසින් පෙන්වන්නේ අනාගත යුද පෙරමුණු වලට පදනම් වන්නේ මූලික කරුණු බවයි. ඒවා ඇතැම් විට දුප්පත් පොහොසත් දෙපක්ෂය අතර විය හැකියි. නොඑසේ නම් උතුර හා දකුණ අතර විය හැකියි.


උතුර–දකුණ අතර විවාදය, ඒ දෙපක්ෂය අතර සුහද සංවාදයක් බවට දියුණු කොට ගත යුත්තේ එවැනි ගැටුම් කල්තියා වළක්වන මහත් වශයෙනුයි. ඉන් පසුව එය අද, හෙට සහ අනිද්දා සඳහා ක්‍රියාත්මක වන ක්‍රියා ධාමයක සම්මත න්‍යාය පත්‍රය බවට පත්කර ගත යුතුයි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

මම විශ්වාස කරන්නේ වර්තමාන අභියෝගයන්ට සාර්ථක ලෙස මුහුණ දිය හැක්කේ ජාතික වශයෙනුත් ජාත්‍යාන්තර වශයෙනුත් අප අතර ඇති කරගන්නා සාමූහික අධිෂ්ඨානයත්, සමගිසම්පන්න ක්‍රියාදාමයත් මගින් පමණක් බවයි. මේ අභියෝගය වෙන අයෙකුට පැවරීමට බැහැ. මෙය අපගේ ලෝකයයි. අප එහි ජීවත්විය යුතුවා පමණක් නොවේ. අප ජීවත්වන ලෝකය සැම දෙනෙකුටම ජීවත්වීමට යෝග්‍ය ස්ථානයක් බවට අපම දියුණු කළ යුතුයි.

දෙවො වස්සතු කාලෙන
සස්ස සම්පත්ති හොතුච
පීතො භවතු ලොකොච
රාජා භවතු ධම්මිකො

කල් වැසි වසීවා
කෙත්වතු සාර වේවා
සත් සිත් නිවේවා
රජය දැහැමිව ලොවැඩ වේවා



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

## තුන්වන ලෝකයේ . . . .

ජනගහනය
සමස්ථ ලෝක
ජනගහනයෙන්
70% කට වැඩිය



වෙළඳ නැව්
ප්‍රමාණය
ලෝකයේ තිබෙන
සංඛ්‍යාවෙන්
10% කි



දුම්රිය
ගමනාගමනය හා
ප්‍රවාහනය දළ
වශයෙන් 12% කි



ගුවන් විදුලි ග්‍රාහක
හා සම්ප්‍රේෂක
යන්ත්‍ර ලොව ඇති
ප්‍රමාණයෙන් දළ
වශයෙන් 20% කි



කාර්මික නිමැවුම
ලෝක කාර්මික
නිමැවුමෙන් දළ
වශයෙන් 8% කි



දළ ජාතික
නිෂ්පාදිතය ලෝක
දළ ජාතික
නිෂ්පාදිතයෙන් දළ
වශයෙන් 10% කි



වෙළඳාම ලෝක
වෙළඳාමෙන්
20% කට අඩුය



පර්යේෂණ හා
සංවර්ධන
ධාරිතාව දළ
වශයෙන් 5% කි



ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය